# දළඹුවට පාඩමක්



මොවින්දි මෙතුජා

# දළඹුවාට පාඩමක්

මොවින්දි මෙතුජා

කතා

පාසල : මහාමායා බාලිකා විදුහල - මහනුවර

පංතිය : 2 ශ්‍රේණිය E

ISBN අංකය : 978 - 624 - 208 - 746 - 7

කෘතිය පල කරන දිනය : 2025.02.08

# පිදුම

මට සිප්සතර හැදෑරීමට ඉඩහසර

ලබා දුන් මාගේ ගරු විදුහල් මහමායා මාතාවට

මාගෙ මේ කෘතිය ගෞරවයෙන්

සෙනෙහසින් පුද කරමි.

තවද, මාගේ දයාබර ගුරු මැණිවරුන්ට,

මාගේ දෙමාපියන්ට ද මිතුර මිතුරියන්ට ද

ආදරයෙන් පුද කර සිටිමි

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකෝමත් එක කාලෙක

සමනල් අක්කෙකුයි

දළඹු පැංචෙකුයි හිටියා.

දවසක් උදේ සමනල්

අක්කා එළියට ගියා.

සමනල් අක්කා දැක්කා

ළමයෙක් සෙල්ලම් කරනවා.

සමනල් අක්කා ඒ දිහාවට

ගියා. ළමයා සමනලයාව

දැකලා සමනලයාගේ

පස්සෙන් දුවන්න පටන්

ගත්තා.



දළඹු මල්ලී ඒක දැක්කා.

දළඹු මල්ලී හිතුවා ඒක සමනල්

අක්කාට කරදරයක් කියලා.

එයා ළමයා ඒ හරියෙන් යනකොට

එයාගේ පිටේ තිබෙන බූව

ළමයාගේ ඇගේ ගෑවා.

ටික වේලාවකින් ළමයා

අඩන්න පටන් ගත්තා.

ළමයාගේ ඇඩිල්ලේ සද්දේ

ඇහිලා අම්මයි ආච්චියි එළියට ආවා.



බූවක් ගෑවිලා අම්මා කිවුවා.

ආච්චි ඉක්මනට පොල් තෙල්

එක ගෙනල්ලා ගෑවා.

සමනල් අක්කාට හරිම දුකයි.



සමනල් අක්කා වේලිච්ච කෝට්ටක්

කඩාගෙන දළඹු මල්ලී ළගට ගියා.

මොකද්ද මල්ලී අර

කරපු නරක වැඩේ,

ආයේ කවදාවත්

එහෙම වැඩක් කරන්න එපා.



දුකෙන් කල්පනාවෙන් රෑ

නින්දට ගිය දළඹු මල්ලී උදේන්ම

ඇහැරිලා කොළයක් කන්න හදද්දීම

පොල්කිච්චෙක් ඇතින් පියාඹාගෙන

ඇවිල්ලා දළඹු මල්ලී සිටි ගසේ වැහුවා.

දළඹු මල්ලී වෙව්ලන්න පටන් ගත්තා.



ගෙදර සිටි මල්ලී එළියට ආවා.

අම්මේ මෙන්න පොල්කිච්චෙක් ඇවිල්ලා,

මල්ලී කෑගැසුවා.

පොල්කිච්චා බයවෙලා

ඉගිලිලා ගියා.



දැක්කා නේද මල්ලී

හැමෝගෙන්ම අපිට

උදවු ඕන වෙනවා.

සමනල අක්කා

එතැනට ඇවිල්ලා කිවුවා.

පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කළාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්විම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්